**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.09.03**
**පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)**

2024 වර්ෂයේ III කාර්තු වෙහි III වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024.09.03 දින නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කාර්යාලයේ දී පැවැත් වූ අතර එහි රැස්වීම් වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

2024.09.03 වන දින පෙ.ව.9.30 ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) කේ.ආර්.අබේසිරිවර්ධන මයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එදින එතුමා විසින් පැමිණ සිටි සියළු නිලධාරීන් පිළිගෙන රැස්වීමේ කටයුතු ආරම්භ කෙරුණි.

**සහභාගී වූ නිලධාරීන්**

01. කේ.ආර්.අබේසිරිවර්ධන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
02. ආර්.පී.ගුණවර්ධන මිය - අධ්‍යක්ෂ (ගොඩනැගිලි) - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
03. ටී.කේ.ආර්.දිලේෂිකා මිය - ප්‍රධාන ගණකාධිකාරි  පළාත් ඉංජිනේරු කර්යාංශය (බ.ප.)
04. එම්.කේ.සුගත් ද සිල්වා මයා - විගණන අධිකාරි - ජාතික විගණන කාර්යාලය.
05. පී.පී.විජේවීර මිය - අභ්‍යන්තර විගණක - අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව (බ.ප.)
06. පී.එල්.ඩී.ඒ.එස්.පනාගොඩ මිය - අධ්‍යක්ෂ ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
07. ඩී.පී.මානවඩු මයා - මුලස්ථාන ඉංජිනේරු - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
08. එල්.එම්.ඩී.ආර්.ද මෙල් මිය - ගණකාධිකාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
09. ජී.ඩී.විපුලසේන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බත්තරමුල්ල.
10. ඒ.කේ.රුවන් අලවත්ත මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මීගමුව.
11. එෆ්.බී.සම්පත් මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හොරණ.
12. එස්.ඩී.සේනාරත්න මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - පානදුර.
13. පී.ආර්.මධුරංග මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මිනුවන්ගොඩ.
14. ඉනෝකා කොටඹගේ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - බියගම.
15. එල්.ඩී.ගලබඩ මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - ගම්පහ.
16. ඒ.ඒ.ද සොයිසා මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - හෝමාගම.
17. ඩබ්.ජී.ආර්.වේලාතන්ත්‍රි මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - මතුගම.
18. එච්.එස්.වන්දන මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - වත්තල.
19. ඩී.සී.එන්.කලන්සූරිය මයා - ප්‍රාදේශීය ඉංජිනේරු - කළුතර.
20. ආර්.ඩබ්.සී.ගුණවර්ධන මිය - ප්‍රාදේශීය ඉංජිනේරු - රත්මලාන.
21. ඒ.එච්.සේනාරත්න මිය - ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
22. ඩබ්.අයි.නිලාන්ති මෙය - මුදල් සහකාර - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
23. ඩබ්.එන්.සී.කුරේ මිය - කළමනාකරණ සේවා නිලධාරි - පළාත් ඉංජිනේරු කාර්යාංශය (බ.ප.)
24. එල්.එස්.පී.පෙරේරා මිය - කළමනාකරණ සේවා නිලධාරි  පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)
25. ඩබ්.කේ.එම්.ඩී.එන්.කුලසේකර මෙය -කළමනාකරණ සේවා නිලධාරි-පළාත් ඉංජිනේරු කාර්යාංශය(බ.ප.)

## 01. <u>පසුගිය විගණන කමිටු වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීම</u>

<table>
<tr><th></th><th>කාරණය</th><th>සාකච්ඡා වූ කරුණු/ තීරණ</th><th>වගකීම</th></tr>
<tr><td>01</td><td>මාසික බැංකු සැසඳුම්</td><td>මේ වන විට සියළුම කාර්යාල විසින් බැංකු සැසඳුම් මෘදු පිටපත නියමිත දින වන විට අභ්‍යන්තර විගණන කාර්යාලයට එවා ඇති බවත් ඒ ආකාරයෙන්ම දිගටම කරගෙන යන ලෙස අභ්‍යන්තර විගණක ප්‍රකාශ කරන ලදී.<br><br>බැංකු සැසඳුමේ මෘදු පිටපත පමණක් සෑම මසකම ඊලග මස 15 දිනට පෙර අභ්‍යන්තර විගණනය වෙත ඉදිරිපත් කරන ලෙස නැවතත් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට දැනුවත් කරන ලදී.<br><br>2024.08.31 දින වන විටත් හය මස ඉක්ම වූ චෙක්පත් හෝ හඳුනා නොගත් ලැබීම් කිසිදු කාර්යාලයක නොතිබිණ.<br><br>සෑම වසරකම වගේ දෙසැම්බර් මස 31 ලියනු ලබන චෙක්පත් මාස ගණන් නිරවුල් නොවී පැවති බැවින් ඉදිරියේ දී දෙසැම්බර් මාස 31 ලියනු ලබන චෙක්පත් කඩිනමින් නිරවුල් කර ගැනීමට පෞද්ගලික තම අවධානය යොමු කර මාස 02 ක් ඇතුලත නිරවුල් කර ගැනීමට වගබලා ගන්නා ලෙස නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු) විසින් ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට දැනුවත් කරන ලදී.</td><td>ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරු</td></tr>
<tr><td>02</td><td>අත්තිකාරම් 'බී' ගිණුමට අදාලව ණය අය නොවීම.</td><td>මෙතෙක් ණය ශේෂ නිරවුල් නොකර ඇති පළාත් පාලන ආයතන වෙත 2024.07.17 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ද පිටපත් සහිතව අදාල පළාත් පාලන ආයතනයන් වෙත ණය ශේෂ නිරවුල් කරන ලෙස දන්වන ලදී.<br>2024.08.31 දිනට නොපියවා ඇති ණය අයවීම් පිළිබඳ වාර්තාව<br><br>
<table>
<tr><th>අනු අංකය</th><th>නිලධාරිගේ නම</th><th>තනතුර</th><th>ස්ථාන මාරුවී ගිය දිනය</th><th>2024.08.31 දිනට අයවිමට ඇත ණය ශේෂය රු.</th></tr>
<tr><td></td><td colspan="4">පළාත් පාලන ආයතන වලට ස්ථාන මාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයන්</td></tr>
<tr><td>1</td><td>සී.කේ.තන්තුලගේ</td><td>රියදුරු</td><td>2019.06.03</td><td>ණය ශේෂය පියවා අවසන්</td></tr>
<tr><td>2</td><td rowspan="2">ඩබ්.ඒ.ටී.එස්. වනිගසුන්දර</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.01.01</td><td>රු.115,970.00</td></tr>
<tr><td></td><td colspan="3">2024.06.11 දිනැති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි මෙම ණය ශේෂයන් පියවීම පිළිබඳ තොරතුරු 2024.07.12 දිනැති ලිපිය මඟින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය වෙත දැනුම් දී ඇත. ඒ අනුව එම ණය ශේෂය එකවර පියවීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ආදායම් හා මුදල්) විසින් 2024.07.17 දිනැති ලිපිය මඟින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත.</td></tr>
<tr><td>3</td><td rowspan="2">අයි.පී.ආර්.පෙරේරා</td><td>කළමනාකරණ සහකාර</td><td>2020.02.17</td><td>රු.3,000.00</td></tr>
<tr><td></td><td colspan="3">තවදුරටත් අය විය යුතු ණය ශේෂය රු.3,000.00 ක් වන අතර එම ශේෂය කඩිනමින් පියවීමට කටයුතු කරන ලෙස 2024.08.20 දිනැති ලිපිය මඟින් කොළඹ මහා නගර සභාව වෙත දැනුම් දී ඇත.</td></tr>
</table>
</td><td>ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 4 | පී.පී.එල්.ආලෝකා | තාක්ෂණ නිලධාරි | 2020.02.10 | රු.106,834.00 |
| | | 2024.06.11 දිනැති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමෙදී සාකච්ඡා වූ පරිදි මෙම ණයශේෂයන් පියවීම පිළිබද තොරතුරු 2024.07.12 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය වෙත දැනුම් දී ඇත. ඒ අනුව එම ණය ශේෂය එකවර පියවීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ආදායම් හා මුදල්) විසින් 2024.07.17 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම් දී ඇත. | | |
| 5 | එස්.යු.විමලසිරි | කළමනාකරණ සහකාර | 2023.01.01 | රු.95,000.00 |
| | | 2024.08.13 දින කුවිතාන්සි අංක S362885 මගින් ණය ශේෂය ගෙවා අවසන් කර ඇත. | | |
| 6 | ආර්.පී.එස්.විදුරංග | කළමනාකරණ සේවා නිලධාරි | 2023.07.17 | 214,961.00 |
| | | 2024.06.08 දින සිට සේවය හැර යාමෙ නිවේදන නිකුත් කර ඇත. එබැවින් ණය ශේෂය ගෙවීම් කරන ලෙස 2024.08.26 දිනැති ලිපිය මගින් නිලධාරියා වෙත දැනුම් දී ඇත. | | |
| | **එකතුව** | | | **440,765.00** |
| | **රජයට /වෙනත් පළාත් සභාවකට /පළාත් සභාවේ වෙනත් කාර්යාලයකට ස්ථානමාරුවී ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ - විදේශධූත සේවය සඳහා** | | | |
| 7 | එම්.එච්.ගුණසේකර | කළමානකාරණ සේවා නිලධාරි | 2020.02.07 | 86,400.00 |
| | | රු.7,800/- බැගින් කාර්තු වශයෙන් ණයවාරික නිරවුල් කරනු ලබයි. | | |
| | **සේවය හැර ගොස් ඇති නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ** | | | |
| 8 | ආර්.ජ්.එම්.එම්. රණසිංහ මිය | තාක්ෂණ නිලධාරි | 2013.01.15 | 119,689.00 |
| | | තාක්ෂණ නිලධාරි ආර්.ජ්.එම්.එම්.රණසිංහ මිය සමථ මණ්ඩලය වෙත සහභාගි නොවීම මත ලබාදුන් නිරවුල් නොකිරීමෙ සහතිකය පදනම් කර ගනිමින්, බස්නාහිර පළාත් නීති ඒකකය මගින් ඇය සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. නමුත් මේ දක්වාත් එහි ප්‍රගතිය පිළිබඳව තොරතුරක් නොවූ බැවින් එම අංශය වෙතින් අංක CSWP/ENG-ADM/26-8/FI/1 හා 2024.08.12 දිනැති ලිපියෙන් විමසන ලදූව, නීති අංශයෙන් මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව වෙතින් අංක CSWP/ADM-LEG/10-1/FI/19 හා 2024.08.21 දිනැති ලිපියෙන් වර්තමාන ප්‍රගතිය විමසා ඇත. | | |

| | | | |
|---|---|---|---|
| | | 2024.06.11 දිනැති විගණන හා කළමණාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි මෙම පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරින්ගේ නොපියවා ඇති ණය ශේෂයන් පියවීම පිළිබඳ තොරතුරු 2024.07.12 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය වෙත දැනුම් දී ඇත. ඒ අනුව එම ණය ශේෂය එකවර පියවීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ (ආදායම් හා මුදල්) විසින් 2024.07.17 දිනැති ලිපිය මගින් පළාත් පාලන කොමසාරිස් දැනුවත් කර තිබුණද මේ දක්වා එම ණය ශේෂ පියවා නොමැති බව නැවතත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් මූල්‍ය වෙත දැන්වීමට තිරණය විය.<br><br>කොළඹ නගර සභාවවේ රෝග නිවරණ දෙපාර්තමේන්තුවට ස්ථාන මාරු වී ගිය කළමානකාරණ සේවා නිලධාරි අයි.ජී.ආර්.පෙරේරා මියගෙන් තවදුරටත් අයවිය යුතු රු.3,000.00 මුදල සම්බන්ධයෙන් මුල්‍ය චක්‍ර ලේඛ 11/2024 අනුව කටයුතු කරන ලෙස අභ්‍යන්තර විගණන පැහැදිලි කරන ලදි.<br><br>මේ වන විට 2024.06.08 දින සිට සේවය හැර යාමේ නිවේදන නිකුත් කර ඇති කොළඹ නගර සභාවට ස්ථාන මාරු වී ගිය කළමානකාරණ සේවා නිලධාරි ආර්.පී.එස්.විදුරංග මයා අවසන් වරට සේවයේ යෙදි සිටියේ කොළඹ මහ නගර සභාවේ බැවින් ණය ඔහු විසින් ලබා ගෙන ඇති ණය මුදල අයකර ගැනිමට අදාල නීතිමය ඉදිරි කටයුතු එම කාර්යාලයෙන් සිදු කළ යුතු බව අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණක විසින් පැහැදිලි කරන ලද අතර ඒ අනුව මෙම නිලධාරියා විසින් ලබා ගෙන ඇති ණය මුදල අයකර ගැනිමට නීතිමය ක්‍රියාමාර්ග ගැන්මට අවශ්‍ය ක්‍රියා මාර්ග යන්නා ලෙස කොළඹ මහ නගර සභාව වෙත දන්වා යවන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි. | |
| 03 | කල් ඉකුත්වූ තැන්පතු | ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ වසර දෙක ඉක්ම වූ තැන්පතු 05 න් 2024.06.28 දින තැන්පතු 04 ක් රජයේ ආදායමට බැර කර ඇති අතර රු.674,632.20 ක තැන්පතුවට ආදාල ව්‍යාපෘතියේ වැඩවල අඩුපාඩු සකස් කරමින පවතින බැවින් එම අඩුපාඩු සකස් කල වහාම එම රැඳවුම් මුදල් නිදහස් කිරිමට කටයුතු කරන බව ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරු දන්වා ඇත.<br><br>රු.674,632.20 තැන්පතු මුදල මේ සතිය තුල නිරවුල් කර අවසන් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් ගම්පහ ප්‍රාදේශීය ඉංජිනේරුට උපදේස් ලබා දෙන ලදි.<br><br>ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවල වසර දෙක ඉක්ම වූ තැන්පතු නොමැත. | නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු)<br><br>ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී /<br><br>සියලුම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| 04 | මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය (නව සහ පැරණි පිහිටි භූමිය බස්නාහිර. පළාත් සභාවට පවරා ගැනීම | මීගමුව නව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩම සහ පැරණි කාර්යාලය පිහිටි ඉඩම පවරා ගැනීම සඳහා මැණුම් ගාස්තු ගෙවීමෙන් පසු අදාල මැනුම් කටයුතු 2024.07.31 දින ජාඇල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ රජයේ මිනින්දෝරු නිලධාරි ආර්.ඒ.ටී.රංගන මහතා විසින් සිදු කරන ලද බවත්, මෙම භූමි ප්‍රදේශය අයත් 158 බී වැල්ලවීදිය ග්‍රාම නිලධාරි වසමේ ග්‍රාම නිලධාරි සහ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ ප්‍රාදේශීය ඉංජිනේරු ඒ.කේ.ආර්.අලවත්ත මහතාගේ සහභාගිත්වයෙන් එම කටයුත්ත සිදු කළ බව මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු ගේ අංක CSO/ENG/13/5 සහ 2024.08.09 දිනැති ලිපිය මගින් දන්වා ඇත.<br><br>මැනුම් කටයුතු සිදු කලද තවම පිඹුරුපත් ලැබී නොමැති බැවින් නැවත ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් යොමු කරන ලෙස මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් උපදෙස් දෙන ලදි.<br><br>තවද පැරණි ගොඩනැගිල්ල PRDA ආයතනය වෙත ලබාදීම සම්බන්ධයෙන් මේ වන විටත් ප්‍රධාන ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති බැවින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් දෙන ලදි. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු |
| | අවිස්සාවේල්ල ගොඩනැගිල්ල | • 2024.07.31 දිනෙන් පසු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය වෙත ලබා දී ඇති බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ගොඩනැගිල්ල නැවත භාරදෙන බවට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපතිගේ අංක SLTB/HO/02/05/L01/365 සහ 2024.06.12 දිනැති ලිපියෙන් එකඟතාව ප්‍රකාශ කර ඇත.<br><br>• අදාල දිනය පසුවී ඇති බැවින් මේ සම්බන්ධයෙන් වර්තමාන තත්වය හා ප්‍රගතිය නොපමාව වාර්තා කරන ලෙසත්, අදාල පැවරීමේ කටයුතු නොපමාව සිදු කිරීමට කටයුතු කරන ලෙසත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ අංක CSWP/ENG-ADM/41-4/FI/1 සහ 2024.08.06 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපති දැනුවත් කර ඇත.<br><br>• ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සභාපතිගේ අංක SLTB/HO/02/05/L01/412 සහ 2024.08.15 දිනැති ලිපියෙන් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ලැබීමට නියමිතව තිබූ කිසිදු ගොඩනැගිල්ලක් මේ වන තෙක් නොලැබීම හේතුවෙන් තව දුරටත් බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයට අයත් ගොඩනැගිල්ල තුළ ශ්‍රී ලංගම සබරගමුව කාර්යාලය පවත්වාගෙන යාමට අනුමැතිය ලබා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.<br><br>• එකඟ වූ දිනයට මෙම ගොඩනැගිල්ල භාරනොදුනහොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් කැඳවීමට 2024 වර්ෂයේ II කාර්තුවෙහි II වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කර ඇති බැවින්, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ අංක: CSWP/ENG-ADM/41-4/FI/1 සහ 2024.08.22 දිනැති ලිපියෙන් මේ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ උපදෙස් ඉල්ලා ඇත. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / පරිපාලන නිලධාරි/ හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු |

| | | | |
|---|---|---|---|
| | නිල නිවාස | ඉහත ඉල්ලීමට අනුව අවිස්සාවේල්ල ගොඩනැගිල්ල සම්බන්ධ රැස්වීම පැවැත්වීම සඳහා 2024.09.13 දිනය ප්‍රධාන ලේකම් විසින් ලබා දී ඇති බව නි.ප්‍ර.ලේකම්(ඉංජිනේරු) ප්‍රකාශ කරන ලදි.<br><br>නිල නිවාස සෞඛ්‍ය අමාත්‍යාංශයවෙත පවරා දීම සම්බන්ධයෙන් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු වෙතින් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ අංක: CSWP/ENG-ADM/41-4/FI/1 හා 2024.06.28 දිනැති ලිපියෙන් විමසීමක් කර ඇත.<br><br>හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු අංක :SCO/ENG/5/04/CMSO/ නිලනිවාස/2024 හා 2024.07.01 දිනැති ලිපියෙන්<br><br>*නිල නිවාස අංක 04 හි පරිහරණ භුක්තිය වෛද්‍ය අධිකාරි, මූලික රෝහල අවිස්සාවේල්ල වෙත පවරාදී ඇති බව ,<br><br>* නිල නිවාස අංක 03 හි පරිහරණ භුක්තිය වෛද්‍ය අධිකාරි, මූලික රෝහල අවිස්සාවේල්ල විසින් විධිමත්ව ලබාගෙන ඇති බවත්,<br><br>* නිලනිවාස පිහිටි බිම්වල සැලසුම් පිටපත් ලිපි ගොනු වල නොමැති බැවින් අදාල නිල නිවාස වල පිඹුරු සකස් කිරීම සඳහා සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙතින් මිනුම්දෝරු දෙපාර්තමේන්තුව වෙත මැනුම් නියෝග නිකුත් කරන ලෙස ඉල්ලා යවා ඇති බවත්,<br><br>*දේපල පවරා දීමෙදි ප්‍රයෝජනවත් වන භාණ්ඩ සමීක්ෂණ වාර්තා එම කටයුතු අවසන් වූ වහාම නි.ප්‍ර.ලේකම් (ඉංජිනේරු) වෙත ඉදිරිපත් කරන බව දන්වා ඇත.<br><br>මිනුම්දෝරු දෙපාර්තමේන්තුව මිනුම්දෝරුවරුන් වෘත්තිය ක්‍රියාමාර්ග ගෙන ඇති බැවින් මැනුම් කටයුතු ප්‍රමාද වන බව හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රකාශ කරන ලදි.<br><br>නිල නිවාස හතරෙහි භුක්තිය සෞඛ්‍ය අමාත්‍යාංශයට පැවරි තිබුණද මේ ඉඩම් පැවරිමට නොහැකිව ඇත්තේ පිඹුරුපත් නොමැති කම නිසා බැවින් මැණුම් නියෝග ලබා ගැනිම සඳහා නැවත සිහි කැඳවීම් යොමුකර පසු විපරම් කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් ලබා දෙන ලදි.<br><br>නිල නිවාස හතරින් එකක් තවම කවුරුත් පදිංචිව නොමැති බවත් එම නිවස අළුත්වැඩියාකල යුතු තත්වයේ පවතින බැවින් එ සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සමඟ සාකච්ඡාකර එම නිවස අලුත් වැඩියා සඳහා ඇස්තමේන්තුවක් සකස්කර එම නිවස අළුත් වැඩියා කර පදිංචි විමට කවුරු හෝ සිටි නම් පදිංචි කරවීමට කටයුතු සිදු කරන ලෙස නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) විසින් හෝමාගම ප්‍රාදේශීය ඉංජිනේරුට උපදෙස් දෙන ලදි. | |
| 05 | ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) | * අධ්‍යක්ෂ ඉංජිනේරුගේ අංක CSWP/ENG-CON/5-6/FI/1(A) හා 2024.08.16 දිනැති ලිපිය මඟින් බස්නාහිර පළාත් ඉංජිනේරු කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාලයන්හි සියලුම අංශ තුළ රාජකාරී කටයුතු සිදු කිරීමේදී (DMS) පද්ධතිය යොදා ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | නි.ප්‍ර.ලේ. ඉංජිනේරු/ අධ්‍යක්ෂ ඉංජිනේරු ගොඩනැගිලි අධ්‍යක්ෂ / |

| | | | |
|---|---|---|---|
| | (DMS) | * මේ වන විට Process Automation System හරහා ගෙන රාජකාරි කටයුතු කිරීම ගැටළුකාරී වන බැවින් එම රාජකාරි පහසුකරවීම සඳහා තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියේ නිලධාරිනියක 2024.08.13 දින සිට අප කාර්යාංශයට අනුයුක්තව සේවය කරනු ලබන අතර, එම නිලධාරිනියගේ සහයෝගය ඇතිව මෙම මෘදුකාංග පද්ධතිය මගින් රාජකාරි කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.<br><br>* තවද තම අංශය වෙත ලැබෙන තැපැල Scan කර DMSහි ගබඩා කිරීමේ කටයුත්ත මේ වන විට උපදේශන අංශයේ පමණක් සිදු කරන බවත් අනෙකුත් අංශවල නිලධාරීන් හිඟවීම හා සිටින නිලධාරීන්ට වැඩ අධික වීම මත මේ වන විට මෙම කාර්යය ඇණහිට ඇති බව නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් නි.ප්‍ර.ලේ. (ඉංජිනේරු)ගේ අංක CSWP/ENG-ADM/55-1/FI/1(A) හා 2024.08.27 දිනැති ලිපි මගින් සියලුම අංශ ප්‍රධානීන් සහ ප්‍රාදේශීය ඉංජිනේරුවරුන් වෙත උපදෙස් ලබා දෙන දී ඇත.<br><br>ඒ අනුව මෙම ලිපිගොනු කළමනාකරණ ක්‍රියාවලිය සම්බන්ධ මෘදුකාංග පද්ධතිය (DMS) සිදු විය යුත්තේ ලැබෙන හා යවන ලිපි Scan කර ගබඩා කිරීමේ කාර්ය බවත් කබඩ්වල ගොනු ගොඩගසා ගැනීම අවම කිරීමත් ආරක්ෂාවත් යන කරුණු ද පදනම් කර ගෙන ඇති බවත් අධ්‍යක්ෂ උපදේශක පහැදිලි කරන ලදි.<br><br>Process Automation ක්‍රියාවලියේ තවදුරටත් අඩුපාඩු පවතින බැවින් දැනට අරම්භයක් විදියට පෞද්ගලික ලිපි ගොනු හා ව්‍යාපෘති ගොනු Scan කර ගබඩා කිරීමේ කටයුතු කිරීමට තීරණය විය.<br><br>දැනට කරගෙන යන Scan කර DMSහි ගබඩා කිරීමේ කටයුත්ත ඉදිරිට කරගෙන යන ලෙසත් අවධාරණය කරන ලදි. | |
| 06 | කළුතර පානදුර උපාධ්‍යා විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම සම්බන්ධව | පුරා විද්‍යා වටිනාකමක් ඇති බවට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කලින් ලිපියක් දී තිබු බැවින් මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීම නතර කල අතර පසුව පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් පුරා විද්‍යා වටිනාකමක් නැති බව දන්වා ඇත. එබැවින් මෙම ගොඩනැගිල්ල පාසැලට අවශ්‍ය නැත්නම් අධ්‍යාපන අමාත්‍යාංශයේද අනුමැතිය ඇත්නම් වර්තමාන තත්වය සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් වාර්තාවක් ලබාගෙන මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් කිරීමට තීරණය විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / ගොඩනැගිලි අධ්‍යක්ෂ / පානදුර ප්‍රාදේශීය ඉංජිනේරු |

<u>2 ) විගණන අධිකාරියේ අදහස් හා පැහැදිලි කිරීම</u>

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | මෙම වර්ෂය තුල ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල ප්‍රගතිය සම්බන්ධ වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරන ලදි |
| 2 | කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේදී තරඟකාරී මිල ගණන් යටතේ ලබාදීම වඩාත් යෝග්‍ය බවත්, ඒ සඳහා වැඩි පුර උත්සහ දරන ලෙසත්, සමිතිවලට කොන්ත්‍රාත් ලබා දෙනවාට වඩා රජයට වාසිදායක බවත් නැවතත් පෙන්වා දෙන ලදි |

| | |
|---|---|
| 3 | DMS මෘදුකාංගයේ දැනට පටන්ගෙන ඇති බැවින් එය අතරමග නතර කිරීම ගැටළු සහගත බව බැවින් මෙහි අඩුපාඩු සකස් කර ක්‍රියාකාරී තත්ත්වයට පවත්වාගෙන යාමට කටයුතු කරන ලෙසත්, යම් මෘදුකාංගයක් ඉදිරියේදී සකස් කරන්නේ නම් එට ආයතනයේ අරමුණට ගැලපෙන ආකාරයේ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර ක්‍රියාකර හැකි ආකාරයට මෘදුකාංග පද්ධති සකස්කර ගැනීමට කටයුතු කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. |

**<u>(3) අධ්‍යක්ෂ අභ්‍යන්තර විගණනකගේ අදහස් හා පැහැදිලි කිරීම්</u>**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | බැංකු සැසඳුම් නියමිත දින වන විට විගණනය වෙත ඉදිරිපත් කර ඇති බවත් හඳුනානොගත් වටිනා කම් ලෙස බත්තරමුල්ල කාර්යාලයේ රු.25.00 ක් හා හෝමාගම කාර්යාලයේ රු.3,000.00 ක් පවතින බව පෙන්වා දෙන ලදී. |
| 2. | අත්තිකාරම් බී ගිණුමේ ඇති ගැටළු මේ වර්ෂයේ නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලෙසත්. |
| 3. | කඩා ඉවත්කල යුතු ගොඩනැගිලි සම්බන්ධයෙන් කඩිනමින් අනුමැතිය ලබා දීමට කටයුතු කරන ලෙසත් , ගොඩනැගිලි කඩා ඉවත් කිරීමට අදාලව ලේඛනයක් පවත්වාගෙන යාම සුදුසු බවත් ඒ තුලින් අධීක්ෂණය පහසු වන බවත්, |

**<u>අධ්‍යක්ෂ - ගිණුම් හා ගෙවීම්ගේ අදහස් හා පැහැදිලි කිරීම්</u>**

| | මතුකළ කරුණු |
|---|---|
| 1 | |

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම පවත්වා අදාල කරුණු සාකච්ඡා කිරීම ඉතා වැදගත් බවත්, එම කරුණු සම්බන්ධයෙන් විගණනයෙන් ලබාදෙන ලද වටිනා අදහස් රාජකාරි කටයුතු වලදී ඉතා ප්‍රයෝජනවත් බවත්, ඔබගේ වටිනා කාලය වැයකර මෙම රැස්වීම සඳහා සහභාගී වීම සම්බන්ධයෙන් රජයේ විගණන අධිකාරි, අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක, පැමිණි සියළුම ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්ට හා අනෙකුත් සහභාගී වූ සියළු නිලධාරීන්ට නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ස්තූතියපල කිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු පස්වරු 11.45 ට පමණ අවසන් කරන ලදී.

ඉ.ජී.ජේ.ආර්.අබේසිරිවර්ධන
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු),
පළාත් ඉංජිනේරු කාර්යාංශය,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 0112092524
ෆැක්ස් අංකය : 0112092523
විද්‍යුත් ලිපිනය : eng.org.acc@gmail.com